# සුනාමිය ගැන පසුවදනක්

සුනාමිය ගැන බොහෝ දෙනා කතාකළහ. සිංහලයන්ගේ නිර්මාණශීලීත්වය දක්වමින් සුනාමිය යන්න අද භාෂාවට එක් වී ඇත. සංචාරක සුනාමියක් යන්නෙන් කියැවෙන්නේ සංචාරකයන්ගේ පැමිණීමේ විශාල කඩාවැටීමක් සිදු වී ඇති බව ය. අවුරුදු දෙකක් ගතවීමෙන් පසු සුනාමි වීරයන් බවට රාජ්‍ය නොවන සංවිධාන පත්වීමට දැරූ උත්සාහය එතරම් සාර්ථක වී ඇති බවක් නො පෙනෙයි. එහෙත් එවැනි සංවිධාන පමණක් නොව දානපති දේශමාන්‍ය ආදී විශ්ලේෂණවලින් විස්තරකෙරෙන්නන් ද වෙනත් ම ව්‍යාපෘතියක ද යෙදී ඇති බව පෙනෙයි. ඒ සුනාමිය සම්බන්ධයෙන් අතිමහත් බහුතරයක් සිංහලයන් පෙන්නුම්කරන ලද වීරත්වය, පරිත්‍යාගශීලී බව, සංවිධාන ශක්තිය, ආදිය සඟවා, ඒ වෙනුවට එකකු හෝ කිහිපදෙනකු එකතුවී කරන ලද මැරකම්, ස්ත්‍රී දූෂණ, හොරකම් ආදියට ජනමාධ්‍යයෙහි තැනක්දීම ය. සිංහලයන්ගේ යහපත් ලක්‍ෂණ අමතකකිරීමත් එකකුගේ හෝ කිහිපදෙනකුගේ හෝ දුෂ්චරිත සමස්ත සිංහලයන්ගේ ගති ලක්‍ෂණ ලෙස හුවාදැක්වීමත් සංවිධිතව සිදුවන බව ඉතා පැහැදිලි ය.

සුනාමිය සිදුවී මොහොතකින් මුළු රටම කම්පාවට පත්විය. එයට සංවිධානාත්මක ව මුහුණ දෙන්නේ කෙසේ ද යන්න ආණ්ඩුවට ප්‍රශ්නයක් විය. ඒ ගණයේ ස්වාභාවික ව්‍යසනයකට සියවස් ගණනාවකට රට මුහුණ දී තිබුණේ නැත. එහි දී ඉදිරියට පැමිණියේ සිංහල ජනතාව ය. විශේෂයෙන් ම සිංහල බෞද්ධයෝ තම සංස්කෘතික උරුමයන් සමග ක්‍රියාත්මක වූහ. සිංහල සංස්කෘතියෙහි ඇති මේ ලක්‍ෂණය එවක ම පෙන්වාදෙනු ලැබූ නමුත් ඒ ගැන උනන්දුවක් දැක්වූවෙක් නො වී ය. අවුරුදු දෙකකට පසුව ද නැවතත් ඒ බව සඳහන්කළ යුත්තේ ප්‍රශ්නවලට පිළිතුරු බොහෝ විට සංස්කෘතියෙන් ම සොයාගත හැකි බැවිනි. සුනාමිය සිදු වී පැය කිහිපයක් ඇතුළත සිංහල බෞද්ධයෝ කිසිවකුගේ හෝ මෙහෙයවීමකින් තොරව ස්වේඡාවෙන් විපතටපත් ජනතාව සොයා ගියහ. එහි දී ඔවුහු විපතට පත්වූයේ සිංහලයා ද, ඉස්ලාම් භක්තිකයා ද, එසේත් නැත්නම් දෙමළ ක්‍රිස්තියානි අයකු ද යන්න සොයා නො බැලූහ. නැගෙනහිර පළාතේ ඇතැම් මුස්ලිම් ජනයා කියා ඇති ආකාරයට විපතට පත් තම ජනතාව සොයා පළමුව පැමිණ ඇත්තේ සිංහලයන් ය. බොහෝ අවස්ථාවල භික්‍ෂූන්වහන්සේ ද ඒ සහන කණ්ඩායම් සමග වැඩම කළහ. විපතටපත් පෙදෙස්වලට ගොස් මාර්ග ශුද්ධකිරීම, නිවෙස් සුන්බුන් ඉවත්කිරීම, මළසිරුරු සොයා ගැනීම, ඒ වනතුරු ද ජීවත්ව සිටියවුන් රෝහල් කරා ගෙනයෑම ආදී සියල්ල මුල දී කෙරුණේ සිංහල බෞද්ධයන් අතිනි. ඉන්පසු හමුදාව පැමිණියේ ය. රාජ්‍ය නොවන සංවිධාන, විදේශීයයන්, ඊනියා දානපතියන් පැමිණියේ එයට පසුව ය.

සුනාමියෙන් විපතට පත් ආසියාතික හා අප්‍රිකානු රටවල් අතරින් සුන්බුන් ඉවත්කිරීමේ දී මෙන් ම  ප්‍රතිසංස්කරණ කටයුතුවල දී ද හොඳින් ම ක්‍රියාත්මක වී ඇත්තේ  ලංකාව ය. එයට ප්‍රශංසාව හිමිවිය යුත්තේ සිංහලයන්ට ය. සිංහල බෞද්ධ සංස්කෘතියට ය. එහෙත් අවුරුදු දෙකකට පසුව ඒ බවක් පවසන්නකු සොයාගත හැකි ද? අද කතාකරන්නේ අහවල් රාජ්‍ය නොවන සංවිධානය මෙපමණ නිවාස සංඛ්‍යාවක් ඉදිකෙළේ ය, අහවල් කරාමය සවිකර දුන්නේ ය ආදී කරුණු ය. ඊනියා දේශමාන්‍ය දානපතියන් සුනාමියෙන් විපතට පත් ළමුන් පැහැරගෙන ගොස් තම සිංහල බෞද්ධ විරෝධී කටයුතුවලට යොදාගැනීමට උත්සාහ කර ඇති ආකාරය පිළිබඳ පුවත්පත් හා අනෙක් ජනමාධ්‍ය නිහඬ ය. ඒ ඇතැම්විට වෙළෙඳ දැන්වීම් නොලැබෙය යන සැකය නිසා විය හැකි ය. එසේත් නැත්නම් බොහෝ ජනමාධ්‍ය ද සිංහල බෞද්ධ විරෝධීවීම නිසා විය හැකි ය.

රාජ්‍ය නොවන සංවිධාන පොරොන්දු වූ ආකාරයෙන්  ක්‍රියාත්මක වී නැති බව ද මේවන විට අනාවරණය වී ඇත. කලින් සඳහන්කළ ප්‍රමාණයට නිවෙස් තනාදීමක් සිදු වී නැත. ඇතැම් විදේශිකයන් සුනාමි කඳවුරුවල ළමා අපචාරයේ යෙදුණු බව වාර්තා වී ඇත. කළ දුටු කල වල ඉහගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් ඇතැම් සංවිධාන බෞද්ධයන් අබෞද්ධකිරීමේ ව්‍යාපාර ද පවත්වාගෙන ගිය බව රහසක් නො වේ. එහි දී ඊනියා දේශමාන්‍ය උපාධිධාරීන් ඇතුළු පිරිස් ක්‍රියාත්මක වී ඇත්තේ කෙසේ ද යන්න ද සොයාබැලිය යුතු කරුණක් වුවත් ඒ ගැන ආණ්ඩුව හෝ වෙනත් කවරකු හෝ කිසිදු පියවරක් ගනීවි යැයි සිතිය නො හැකි ය. එසේ වුවත් සිංහල බෞද්ධයන් කිහිප දෙනකු අතින් සිදු වී ඇති වැරදි කිහිපයක් පිළිබඳ ව නිතර කතාකරනු ඇසිය හැකි ය. සිදු වූ සොරකම්, ස්ත්‍රී දූෂණ ගැන කතාකිරීමට කොපමණ ප්‍රබුද්ධයෝ සිටිත් ද? එක්තරා අයකු සුනාමියෙන් මියගිය තැනැත්තියකගේ මළ සිරුර සමග ලිංගික ව හැසුරේනේ ය යන්න නිතර සඳහන්වන්නකි. ඒ ගැන ප්‍රබුද්ධයන්, විශේෂයෙන් ම ප්‍රබුද්ධ කලාකරුවන් කතාකරන්නේ ඒ සිංහල බෞද්ධයන්ගේ පොදු ලක්‍ෂණයක් ය යන හැඟීම ප්‍රචාරයවන ආකාරයට ය. මේ

© Prof. Nalin De Silva

සිද්ධිය පිළිබඳව ජාත්‍යන්තර කීර්තියට පත්විය හැකි චිත්‍රපටියක් නිෂ්පාදනයකිරීමට ප්‍රබුද්ධයකුට මතක් නොවුණේ ඇයි ද යන්න ප්‍රශ්නයකි. ඒ මියගිය තැනැත්තිය දෙමළ බව නිරූපණය වන අයුරින් චිත්‍රපටිය නිපදවා ඉහළම සම්මාන ලබාගැනීමේ හැකියාව ඇති බව අප මෙහි දී අමතක නොකළ යුතු ය. විශේෂය සාමාන්‍ය බවට පත්කිරීම සිංහලයන් හා අසිංහලයන් සම්බන්ධයෙන් සිදුවන්නේ දෙයාකාරයකට ය. සිංහලයන් කිහිප දෙනකුගේ අගුණ මුළු මහත් සිංහල ජාතියට ම සාමාන්‍යකරණය වෙයි. සිංහලයන්ගේ යහගුණ අමතක කෙරෙයි. ඒ අතර විදේශිකයන් ද ඇතුළු අසිංහලයන්ගේ අගුණ අමතක කෙරෙයි. එහෙත් ඔවුන් එකකු දෙදෙනකු කර ඇති යහපත් ක්‍රියාවක් අදාළ සංස්කෘතියෙහි යහ ගුණයක් ලෙස ඉදිරිපත් කෙරෙයි. පසුගිය දිනක අරාබි රටක එලිච්චියක සමග ලිංගික ව හැසුරුණු පුද්ගලයකු ගැන වාර්තා වී තිබුණි. ඒ සමග එලෙස එළදෙනකු සමග හැසුරුණු සිංහලයකු ගැන ද වාර්තා වී තිබුණි. මෙවැනි සිද්ධි විනය පිටකයෙහි ද සඳහන් වන බැවින් එහි ඇති අරුමයක් නැතැයි කිසිවකුට කිවහැකි ය. එහෙත් ඒ සිද්ධි ගැන ප්‍රබුද්ධයන් කටයුතුකරන්නේ දෙයාකාරයකට ය. අරාබිකරයේ දී සිදු වූ දේ සම්පූර්ණයෙන් ම අමතකකෙරෙයි. එහෙත් ලංකාවේ දී සිදු වූ හැසිරීම සිංහල බෞද්ධ රටක සිදු වූ දෙයක් ලෙස සඳහන්කරන්නේ සිංහල බෞද්ධ මුවහමට තඩිබාමිනි.

සුනාමියෙන් විපතට පත්වුවන්ට නිවෙස් තනා දීමෙහි දී සිංහල බෞද්ධයෝ මුලික ව ක්‍රියාකළ හ. එහි දී ද භික්ෂූන්වහන්සේ ගේ දායකත්වය ඉමහත් ය. ආණ්ඩුව සුනාමි සහනාධාර එකතුකිරීම සඳහා සැලසුම්කළ විට එයට වැඩියෙන් ම දායක වූයේ සිංහල බෞද්ධයන් ය. ඒ ජනගහණයෙන් සිංහල බෞද්ධයන් වැඩිකම නිසා ම සිදු වූවක් යැයි තකතීරු ප්‍රබුද්ධයකු පවසනු ඇත. එහෙත් ප්‍රතිශතයක් ලෙස සැලකුව ද සිංහල බෞද්ධයන්ගේ දායකත්වය ඉහළ බව පෙනී යනු ඇත. තම කණ කර පවා දන්දීමට දුප්පත් පොහොසත් භේදයකින් තොරව සිංහල බෞද්ධ කාන්තාවෝ ඉදිරිපත් වූහ. ඒ දන්දීම හා අනුන්ගේ විපතෙහි ද කම්පාවීම සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ලක්ෂණ වීම නිසා ය. එහෙත් ඒ සියල්ල ප්‍රබුද්ධයෝ අමතකකරති.

සුනාමියට පසුව ඇමරිකා එක්සත් ජනපදවල ඇති වූ සුලි සුළංවලින් පසුව යථා තත්වයට පැමිණීමට ඔවුන්ට බොහෝ කල් ගත විය. මධ්‍යගත සංවිධාන ශක්තියක් හා ධනයක් තිබිය දී ඔවුන්ට කළ නොහැකි වූ දෙයක් සිංහල බෞද්ධයන්ට කළහැකි වූයේ සංස්කෘතික ලක්ෂණයක් හේතුකොටගෙන ය. ඇතැම් කරුණුවල දී මධ්‍යගත සංවිධානවලට වඩා විමධ්‍යගත ස්වේච්ඡා සංවිධාන කාර්යක්ෂම වෙයි. (කාර්යක්ෂම යන්න බටහිර කළමනාකරණයෙහි දී යෙදෙන අර්ථයෙන් යොදාගත නො යුතු ය.) මධ්‍යගත කළමනාකරණය මධ්‍යගත නිර්මාණවාදයෙන් ලැබෙන්නකි. බුදු දහමෙහි කළමනාකරණය මධ්‍යගත නො වෙයි. බුදුන් වහන්සේ සසුනට නායකයකු පත්නොකෙළේ ද සාංඝිකත්වය අවධාරණය කෙළේ ද මධ්‍යගත කළමනාකරණය බෞද්ධයන්ට ආගන්තුක බැවිනි. සිංහල බෞද්ධයන්ට මධ්‍යගත පරිපාලනය නො ගැලපෙයි. ඔවුහු මධ්‍යගත පරිපාලනයට, කළමනාකාරීත්වයට අවිඥානික ව විරෝධය දක්වති. ලංකාවේ මධ්‍යගත රාජ්‍ය පරිපාලනය කඩාවැටීමට එක් හේතුවක් එය ය. මධ්‍යගත රාජ්‍ය පරිපාලනය පමණක් නොව පෞද්ගලික ආයතනවල මධ්‍යගත කළමනාකාරීත්වය ද මෙරටට උචිත නො වෙයි. සිංහලයෝ ස්වේච්ඡාවෙන් කුඩා සංවිධානවල ක්‍රියාත්මකවීමට කැමැත්තක් දක්වති. එපමණක් නොව ඔවුහු එහි දී කාර්යක්ෂම ව ක්‍රියාකරති. අද මෙරට කළමනාකරණය උගන්වන ආයතනවල මේ මූලික කරුණ අවධානයට ලක්කෙරෙන්නේ යැයි නො සිතමි. ඔවුන් කරන්නේ බටහිර පොතක ඇති දෙයක් අනුකාරිකව ඉගැන්වීම පමණකි. සිංහලයන් දන්නේ එක්සේසත් රාජ්‍යයක පරිපාලනයක් ගැන ය. බ්‍රිතාන්‍යන් අපට දුන් ඒකීය රාජ්‍යයක් ගැන ප්‍රබුද්ධයෝ කතාකරති. ඔවුන් කියන්නේ 1815 දී, එසේත් නැත්නම් ඊනියා කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවලින් පසුව රට ඒකීය වූ බව ය. එහෙත් ඔවුන් නොදන්නා කරුණක් නම් අනාදිමත් කාලයක සිට මෙරට එක්සේසත් රාජ්‍යයක් තිබූ බවත්, ගැමුණු රජතුමාගෙන් පසුව ඒ සිංහල බෞද්ධ එක්සේසත් රාජ්‍යයක් වූ බවත් ය. එක්සේසත් රාජ්‍යය හා ඒකීය රාජ්‍යය අතර සමානත්වයක් මෙන් ම අසමානත්වයක් ද වෙයි. ඒකීය හා එක්සේසත් රාජ්‍ය දෙකම ව්‍යවස්ථාදායක වශයෙන් ගත්කල මධ්‍යගත වෙයි. එහෙත් පරිපාලනයෙහි දී ඒකීය රාජ්‍යය මධ්‍යගත වන අතර එක්සේසත් රාජ්‍යය විමධ්‍යගත වෙයි. ප්‍රබුද්ධ යැයි කියන පඬියන් නොදන්නවාට එකල ඈපා මාපාවරු සමග රුහුණු මායා පිහිටි යනුවෙන් රට බෙදා තිබුණේ පරිපාලනය (රට කරවීම) සඳහා මිස ව්‍යවස්ථා සම්පාදනයකිරීම සඳහා නො වේ. අප රටට අවශ්‍ය වන්නේ මධ්‍යගත ව්‍යවස්ථාදායකයක් හා විමධ්‍යගත පරිපාලනයකි. විමධ්‍යගත ව්‍යවස්ථාදායකයක හෝ මධ්‍යගත පරිපාලනයක හෝ රට කරවිය හැකි නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva